# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2005 අංක 20 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 ජූලි මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2005 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 8.25 යි.** තැපැල් ගාස්තුව : **රු.5.00 යි**

# 2005 අංක 20 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 ජූලි මස 22 වන දින]

එල්. ඩී.— ඕ. 28/2004.

**1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 20 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) පනතේ දීර්ඝ නාමයේ "තේ සහ රබර් වතු" යන වචන වෙනුවට "තේ, රබර් සහ පොල් වතු" යන වචන ආදේශ කිරීමෙන්, එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1958 අංක 2 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3**. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක— "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) පනත" සහ "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය" පිළිවෙලින් "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත" සහ "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය" යනුවෙන් සඳහන් කළ යුතු බව.

(අ) "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) පනත" යන වචන වෙනුවට "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත" යන වචන ;

(ආ) "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය" යන වචන වෙනුවට "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය" යන වචන ; සහ

(ඇ) "තේ හෝ රබර් වතු" යන වචන වෙනුවට "තේ, රබර් හෝ පොල් වතු" යන වචන,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) පනත" සහ "තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය" සම්බන්ධයෙන් කරනු ලබන සෑම සඳහනක්ම, පිළිවෙලින් "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනතට" සහ "තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයට" කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතුකිරීමෙන් :—

"(3) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් සියයකට අඩු නොවන වත්තක් හෝ පොල් වත්තක් කැබලිවලට බෙදීමෙන් සංස්ථාපිත කුඩා වත්තක්, එම බෙදීම සිදුකරනු ලැබ ඇත්තේ අයිතිය පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුව නම් මිස, හෝ එම පොල් වත්ත මණ්ඩලයේ පූර්ණ අනුමතිය ඇතිව බෙදා වෙන් කිරීම නිසා සහ කරනු ලැබුවේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසිවලට අනුකූලව නම් මිස, එම වත්ත හෝ කුඩා වත්ත ඉහත සඳහන් පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

මේ උපවගන්තියේ "කුඩා වත්ත" යන්නෙන්, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරනු ලැබූ බවට සලකන යම් කුඩා පොල් වත්තක් අදහස් වේ."; සහ

(2) එම වගන්තියෙහි පැති සටහනෙහි "හා රබර් පාලන පනත" යන වචන වෙනුවට "රබර් පාලන පනත සහ පොල් සංවර්ධන පනත" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) යන ඡේද ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 9 වන වගන්තිය යටතේ පත්කරන ලද තේ කොමසාරිස් ;

(ඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපතිවරයා ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ 4 වන වගන්තිය යටතේ නම් කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ;

(ඊ) 1979 අංක 17 දරන ජතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ;

(උ) වැවිලි කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ඌ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයෙක් ; සහ

(එ) තේ, රබර් සහ පොල් වතුවල සම්බන්ධතා නියෝජනය කිරීම සඳහා (මේ වගන්තියෙහි "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනෙක්. " සහ

(2) එම වගන්තියේ (3), (4) සහ (5) යන උපවගන්තිවල "නිල නොලත් සාමාජිකයා" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ඒ වෙනුවට "පත් කළ සාමාජිකයා" යන වචන ආදේශ කිරීමෙන්.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (අ) ඡේදයේ "යෙදවිය හැකි ය ; සහ" යන වචන වෙනුවට "යෙදවිය හැකි ය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (ආ) ඡේදයේ "යෙදවිය හැකි ය," යන වචන වෙනුවට "යෙදවිය හැකි ය ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එම වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ එකඟත්වය ඇතිව පොල් වත්තකට අදාළව මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ යම් කාරණාවක් මත විමර්ශනය කිරීමේ හෝ වාර්තා කිරීමේ කාර්ය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ යම් නිලධරයකු යෙදවිය හැකි ය ;".

*ප්‍රධාන ප්‍රඥප්තියට 12අ සහ 12ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 12 අ සහ 12ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

*"අරමුදලක් පිහිටුවීම.*

12අ. (1) මේ පනතේ කාර්ය සඳහා මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අරමුදලට දායක වූ මුදල්වලින් සංයුක්ත වන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම අරමුදල මණ්ඩලය විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යන පනත්වල පටහැනිව කුමක් සඳහන් වුව ද, පිළිවෙලින් රබර් පාලකවරයා, පොල් සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කළ යුතු මුදලක්, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදලට වාර්ෂිකව ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලට බැරව ඇති මුදල්, මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම ඇතුළු මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී මණ්ඩලයට දැරීමට සිදුවන සියලු වියදම් පියවීමේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.

*අරමුදලේ ගිණුම් විගණනය කිරීම.*

12ආ. (1) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් අරමුදලේ ආදායම සහ වියදම පිළිබඳ යථා පරිදි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, නියම කරනු ලැබිය හැකි ආකෘතියකට අනුව සහ එසේ තීරණය කරනු ලබන විස්තර ඇතුළත් වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කිරීමට, මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සකස් කරන ලද ගිණුම්, එක් එක් ලිත් වර්ෂයේ අවසානයේ සිට මාස තුනක් ඉකුත්වීමට පෙර විගණන කාර්ය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.”.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) “තේ පාලන පනතෙහි මීට පටහැනිව” යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති වචන වෙනුවට “ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, ප්‍රාග්ධන අරමුදලින් ගෙවිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (ආ) ඡේදයෙහි “ගෙවිය යුතු ය ; තව ද” යන වචන වෙනුවට “ගෙවිය යුතු ය ; ”

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

“(ආආ) එවැනි රැස්වීමක්, විමර්ශනයක් හෝ වාර්තාවක් පොල් වත්තකට පමණක් අදාළව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, පොල් සංවර්ධන අධිකාරියේ මුදලින් ගෙවනු ලැබිය යුතු ය ; තව ද ; ”;

(ඈ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

“(ඇ) එවැනි රැස්වීමක්, විමර්ශනයක් හෝ වාර්තාවක් තේ, රබර් සහ පොල් වත්තකට ඒකාබද්ධව අදාළ වෙමින් හෝ එම වතුවලින් එකකට කොටසක් ද තවත් එකකට තව කොටසක් ද අදාළ වෙමින්

මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ 12අ වගන්තිය මගින් පිහිටුවන ලද අරමුදලට බැරව ඇති මුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.'' ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මණ්ඩලයේ ලේකම්වරයා සහ වෙනත් නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික, 12අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 23අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 23අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"මණ්ඩලයේ සහතිකයක් ලබා නොගෙන පළාත් පාලන ආයතනවල ඇතැම් නිලධරයන් විසින් කැබලි කිරීම් සැළසුම් අනුමත කිරීම තහනම් කිරීම.

23අ. (1) මේ පනතේ අර්ථානුකූලව, අවස්ථානුකූල පරිදි තේ වත්තක්, රබර් වත්තක් හෝ පොල් වත්තක් වන යම් ඉඩමක කැබලි කිරීමේ සැලැස්මක්, පනතේ 14 වන වගන්තිය යටතේ එම වත්තට අදාළව එකඟත්වය දක්වන සහතිකයක් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇත්නම් මිස, පළාත් පාලන ආයතනයක කිසිම නිලධරයකු විසින් අනුමත කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන පළාත් පාලන ආයතනයක යම් නිලධරයෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු කාර්ය නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් කැබලි කිරීමේ සැලැස්මක් සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද යම් අනුමතියක්, ශූන්‍ය සහ බලරහිත වන අතර, එයට කවර ආකාරයක හෝ නෛතික වලංගුභාවයක් නොමැත්තේ ය.".

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "බෙදුම් නඩුව" යන යෙදුමෙහි අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :—

" "පොල් වත්ත" යන්නෙන්, ප්‍රමාණයෙන් හෙක්ටයාර් හතරකට අඩු නොවන්නා වූ ද, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ ලියාපදිංචි වූ වත්තක් වන හෝ එවැනි වත්තක් ලෙස සලකනු ලබන ඉඩම් ප්‍රමාණයකින් යුත් පොල් වත්තක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් මගින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යයන්ට හා කර්තව්‍යයන්ට අනුරූපී හෝ ඒ හා සමාන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කොට පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.";

(ආ) "රබර් වත්ත" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "හෙක්ටයාර් හතලිහකට" යන වචන වෙනුවට "හෙක්ටයාර් විස්සකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) "තේ වත්ත" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "හෙක්ටයාර් හතලිහකට" යන වචන වෙනුවට "හෙක්ටයාර් විස්සකට" යන වචන ආදේශ කිරීමෙන්.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම ධුර දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ සාමාජිකයන්, මේ පනතේ 5 වන වගන්තිය මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය සංස්ථාපනය කරන තුරු සහ එසේ කරනතුරු පමණක්, එම ධුර දැරීම දිගටම සිදු කළ යුතු ය.

නව මණ්ඩලයක් සංස්ථාපනය කරනතුරු දැනට පවතින මණ්ඩලය දිගටම ක්‍රියාත්මක විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.